# සුද්දෝ සහ කල්ලෝ

ජනාධිපතිනිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී කතාවක් කර ඇත. මේ බව මෙරට පුවත්පත්වල මහා ඉහළින් සඳහන් වෙයි. එහෙත් ඇගේ කතාවට ඇමරිකා එක්සත් ජනපදයේ ජනමාධ්‍ය කිනම් ප්‍රචාරයක් දෙන්නට ඇත් ද? අඩුම තරමින් ලංකාවේ ජනාධිපතිනිය තම රටේ සිටින බවවත් ඇමරිකානුවෝ දනිත් ද? එහෙත් බැරිවෙලාවත් ඇමරිකානු ජනාධිපති ලංකාවට පැමිණියේ නම් මෙරට ජනමාධ්‍ය කෙසේ ක්‍රියාකරනු ඇත් ද? ඇමරිකානු ජනාධිපති නොව ඇමරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය නිලධාරියකු ලංකාවට පැමිණිය ද මෙරට පුවත්පත්වල ඒ බව පළවෙයි. රූපවාහිනියෙහි ඒ බව ප්‍රදර්ශනය කෙරෙයි.

ලංකාවේ ජනාධිපතිනියගේ කතාව ඇමරිකානු ජනමාධ්‍ය විසින් තුන්වැනි ලෝකයේ තවත් නායකයකුගේ හෝ නායිකාවකගේ හෝ කතාවක් ලෙස නොසලකා හරිනු ලැබුව ද, ඒ කතාවට ඇමරිකානු රජ්‍ය දෙපාර්තමේන්තුවේ යම් අවධානයක් ලැබෙන්නට ඇත. ඒ ඊනියා සාමය ගැන ලංකාවේ ස්ථාවරය කෙසේ වෙනස්වන්නේ ද යන්න දැනගැනීමට ය. එහෙත් ඇයට ඒ බව ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවට කීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට යෑමේ අවශ්‍යතාවක් නැත. එය කොළඹ දී ද කිරීමට තිබුණි. එහෙත් එක්සත් ජාතීන්ගේ සංවිධානය අද ක්‍රියාත්මක වන්නේ එක් පැත්තකින් බටහිරයන් තුන්වැනි ලෝකය ලෙස හඳුන්වන රටවල නායක නායිකාවනට  බොරු වැදගත්කමක් ලබා දීමට ය. තවත් පැත්තකින් ඒ රටවල බටහිරයන් විසින් ම ඇතිකරනු ලැබූ මධ්‍යම පාංතික කිහිප දෙනකුට රැකියා ලබාදීමට ය. ඒ අතර බටහිර නොවන ලෝකය පාලනය කිරීමේ ආයතනයක් ලෙස ය.

අද මුළු ලෝකයේ ම වැදගත්කම්,වටිනාකම්, ඇගයීම් ආදී සියල්ල කෙරෙන්නේ බටහිරයන්ට අවශ්‍ය අන්දමට ය. ඒ ඇගයීම් නිර්මාණය කෙරෙන්නේ බටහිර ය. එලෙස නිර්මාණය කෙරෙන ඇගයීම් ඊනියා තුන්වැනි ලෝකයහි පවත්වාගෙනයන්නේ බටහිරයන් විසින් ඒ රටවල ඇතිකරනු ලැබූ මධ්‍යම පංතියක් මගින් ය. අපි උදාහරණයක් සඳහා මුරලිදරන් ගනිමු. ඔහු ලෝක ටෙස්ට් හා එක්දින කණ්ඩායම්වලට තෝරා නොගැනීම පිළිබඳ ව අපි විරෝධය පෑවෙමු. ඒ ගැන කණස්සල්ලට පත්වීමු. මේ ඊනියා ලෝක කන්ඩායම් සමග ක්‍රීඩාකිරීමට වෙනත් ලෝකයකින් කිසිවකු නොඑන බව අප මෙන් ම බටහිරයෝ ද දනිති. එසේ ද වුවත් එවැනි කණ්ඩායමකට තෝරාගනු ලැබීම ක්‍රීඩකයාට මෙන් ම රටට ද ගෞරවයක් වෙයි. මේ ගෞරවය ඇත්තේ කොහේ ද? ඒ එලෙස ගෞරවයක් බව අපට කියාදෙන්නේ කවු ද?

යම් අයුරකින් ලෝක කබඩි කණ්ඩායමක් තෝරාගත්තේ යැයි කියමු. එයට ලංකාවෙන් කිසිවකු ඇතුළත් නොවුවහොත් අපට එහි එතරම් ප්‍රශ්නයක් නො වෙයි. ලංකාවෙන් යමකු ඇතුළත් කරගත්ත ද එය එතරම් ගෞරවයක් ලෙස අපි නොසලකමු. එයට හේතුව ක්‍රිකට් ක්‍රීඩාවට තරම් ගෞරවයක් පිළිගැනීමක් කබඩි ක්‍රීඩාවට  නො වීම ය. එනම් බටහිරයන් විශේෂයෙන් බ්‍රිතාන්‍යයන් හා ඇමරිකානුවන් ඒ ක්‍රීඩාවට ගෞරවයක්, පිළිගැනීමක් ලබා නො දීම ය. අප මුරලිදරන් ලෝක ක්‍රිකට් කණ්ඩායම්වලට තෝරා නොගැනීම පිළිබඳ විරෝධය පළකරන්නේ එසේ කිරීමට ද බටහිරයන් උගන්වා තිබීම නිසා ය. එහෙත් ලංකාවේ ක්‍රිකට් බලධාරීන් ඒ පිළිබඳ තම විරෝධය බටහිරයන් ඉඩ දී ඇති ප්‍රමාණයටවත් කෙළේ යැයි කීමට නො හැකි ය. ඉන්දියාවේ එවැන්නක් සිදුවූයේ නම් ඉන්දීය ක්‍රිකට් බලධාරීන් බටහිරයන් පණවා ඇති සීමාවෙහි හෝ මහත් විරෝධතාවක් පළකිරීමට තිබුණි.

බ්‍රිතාන්‍යයන් ලෝකයක් පාලනය කෙළේ හුදු ආයුධ බලයෙන් නො වෙයි. ඔවුහු ඒ සඳහා විවිධ උපක්‍රම භාවිතා කළහ. එක් උපක්‍රමයක් වූයේ ඔවුන් මෙන් සිතන ඔවුන්ගේ ඇගයීම් හා වටිනාකම් රැගත් මධ්‍යම පංතියක් බිහි කිරීම ය. මේ මධ්‍යම පංතිය බටහිරයන්ට ද වඩා බටහිර ආකල්ප සහිත වූහ. ඒ ඒ රටවල බිහි කෙරුණු මධ්‍යම පංතීන්ගෙන් නිවට ම මධ්‍යම පංතිය ඇත්තේ ලංකාවේ විය හැකි ය. ඉනුදු සිංහලයන් අතර වීය හැකි ය. බටහිරයන් විසින් බිහිකෙරුණු නිවට ම මධ්‍යම පංතිය සිංහල මධ්‍යම පන්තිය යැයි සිතිය හැකි කරුණු බොහොමයක් වෙයි. මේ මධ්‍යම පංතිය තමන්ට ඉංගිරිසින් අනුකරණයකිරීමට හැකිබව පෙන්වීමෙන් ලැබුයේ මහත් ආඩම්බරයකි. ඉංගිරිසි උගතුන්  මෙන්, ලංඩනයේ ජීවත්වන සාමාන්‍ය ඉංගිරිසිකාරයන් මෙන් නොව, හොඳට ඉඅගිරිසි භාෂාව උච්චාරණය කළ හැක්කේ තමන්ට යැයි සිංහල මධ්‍යම පංතිය ගර්වයෙන් කියයි. මේ නැහැදිච්ච ආඩම්බරකම සාමන්‍ය සිංහලයන්ට ඉංගිරිසි ඉගෙනීමට බාධාවක් ද වෙයි. ඉංගිරිසි උච්චාරණයෙහි වැරැද්දක් වුවහොත් සිනහසීමට නැහැදිච්ච ආඩම්බරකාරයෝ

© Prof. Nalin De Silva

බලාගෙන සිටිති. ඉංගිරිසියට බියක් ඇතිකරනු ලැබ ඇත්තේ ද මොවුන් විසින් ය. මේ මධ්‍යම පංතිය ලංකාවට නිදහස ඉල්ලා කෙළේ බ්‍රිතාන්‍යීන්ට පෙත්සම් යැවීම ය. ඒ පෙත්සම් මගින් ඔවුන් කියා සිටියේ තමන්ට ද ඉංගිරිසින් මෙන් ම කටයුතු කළ හැකි බැවින් සීමිත නිදහසක් ලබාදෙන ලෙස ය.

කෙසේ හෝ මුරලිදරන් වෙනුවෙන් නැගිය යුතු ව තිබූ විරෝධය බටහිරයන්ගේ සීමාව තුළවත් නොනැංවීමට බලධරයෝ වග බලාගත්හ. මෙරට කැබිනට් මණ්ඩලය ද සමස්තයක් ලෙස ගත්කල බටහිරයන් ඉදිරියේ විරෝධය පළනොකරන බටහිරයන්ට අවශ්‍ය දේ කියන කරන නිවට මණ්ඩලයකි. මේ නිවට මණ්ඩලයට සුදුසුම නම සාම මණ්ඩලය දැයි වරෙක සිතෙයි. ජනාධිපතිනිය හා ඇගේ සමීප ඇමතිවරු දන්නා එකම කරුණ වී ඇත්තේ සතියකට වරක්වත් කොළඹ දී බැරිනම් නිව්යෝක්හි දී තමන් සාමයට කැප වී ඇතැයි ප්‍රසිද්ධියේ කීම ය. ඒ සාමය අන්කිසිවක් නොව බටහිරයන්ට අවශ්‍ය සාමය වෙයි. එය රටට අවශ්‍ය සාමය නො වීම පිළිබඳ ව ජනාධිපතිනියට වැඩක් නැත. රනිල් වික්‍රමසිංහ මහතා ඊටත් එහා ගොස් ය. යම්අයුරකින් ඒ මහතා ජනාධිපති වී නම් බටහිරයන්ට අවශ්‍ය සාමය, එනම් ඊළමට පාර කපන ඊනිය අන්තර්වාර ස්වයංපාලන අධිකාරිය, මේ වනවිටත් ලබා දී අවසාන ය. කුමාරතුංග මහත්මිය තවමත් නමට හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව බැවින් හා ජනතා විමුක්ති පෙරමුණ සංධාන ආණ්ඩුවේ කොටස්කරුවකුවන බැවින් ඇයට අවශ්‍ය අන්දමට ම කටයුතු කිරීමට නො හැකි ය. කුමාරතුංග මහත්මියගෙන් රටට වන එකම සේවය රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වීම වැළැක්වීම ය. එහෙත් එය වුව ද විශාල සේවයක් බව අප පිළිගත යුතු ය.

බටහිරයන්ට අවශ්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිකිරීම ය. ඒ සඳහා ඔවුන් දැනට ම යම් වැඩ කොටසක් කර ඇත. මේ ආණ්ඩුව බලයට පත් වී මාස හතරක් වැනි සුළු කාලයක දී ආර්ථිකය බලා හිඳිය දී පහතට යන්නේ බටහිරයන්ගේ ද වෙනත් අයගේ ද උපාමාරු හේතුවෙන් ය. ඒ බව බටහිර ආර්ථික විද්‍යාව ඉගෙන නොගත් අයකුට පහසුවෙන් වටහාගත හැකි ය. ජනාධිපතිවරණය වන විට ආණ්ඩුව අප්‍රසාදයට පත්කරවා රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිකරවීම බටහිරයන්ගේ අපේක්ෂාව ය. ඒ මහතා ජනාධිපතිවරණයේ දී සාමය දෙන්නම් කන්න දෙන්නම් කියා රට වටේ යන විට එයට විරුද්ධව සංධානය කරන්නේ කුමක් ද? රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වුවහොත් පැය විසිහතරක් තුළ සංධාන ආණ්ඩුව වැටෙනු ඇත. තොණ්ඩමන් මහතා ඒ වන විට සිටින්නේ කොහේදැයි දැනගැනීමට අංජනම් එළියක් බැලීමට අවශ්‍ය නො වෙයි. ඊනියා සාමයක් ගැන කතාකිරීමට නිව්යෝක් නොගොස් බටහිරයන්ගේ උපක්‍රම පිළිබඳ ඇත්ත රටට හෙළිදරවු කිරීමට හැකි කිසි අයකු සාම මණ්ඩලයේ නැත් ද? අවුරුදු දෙකකින් එළඹෙන ජනාධිපතිවරණය සඳහා අද සිට සංධානය ක්‍රියා නොකළහොත් බටහිරයන්ගේ සාමයෙන් රට ගලවාගැනීම අපහසු කාර්යයක් වනු ඇත.

බටහිරයන් මුරලිදරන් ඊනියා ලොක කණ්ඩායමට තෝරා නොගත්තේ ෂේන් වෝන් ඔහුට වඩා දක්ෂතා පෙන්නුම් කර ඇති නිසා ද? එසේත් නැත්නම් මුරලිදරන් කළු නිසා ද? බටහිරයෝ කළමණාකරණයෙහි දක්ෂයෝ වෙති. කල්ලන්ට තනතුරු දී තම ක්‍රමය පවත්වාගෙන යන්නේ කෙසේ දැයි ඔවුහු දනිති. කොෆී අන්නන් මහතා කළු වුව ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී ඉටුකරන්නේ  කල්ලන්ගේ අවශ්‍යතාව නොව ස්විස් ජාතික භාර්යාව ඇතුළු සුද්දන්ගේ අවශ්‍යතාවය ය. ඉදිහිට ඔහු ඇමරිකාවට දමන ගෝරනාඩුව ද ක්‍රමය පවත්වාගෙන යැමට ඉවහල් වෙයි. අප ලවා ක්‍රිකට් ක්‍රීඩාව ද පවත්වාගෙන යැමට සුද්දෝ සමත් වෙති. එහි දී ඔවුහු රාහුල් ඩ්‍රාවිඩ් ලෝකයේ දක්ෂම ක්‍රිකට් ක්‍රීඩකයා ලෙස පිළිගනිති. වාස් ලෝක  කණ්ඩායම් දෙකට ම තෝරා ගනිති. බැලූ බැල්මට ඔවුහු කල්ලන්ට ද සලකති. එසේ නම් මුරලිදරන්? මුරලිදරන් යනු කල්ලකු පමණක් නො වෙයි. ඔහු දෙමළ ජනයාට තැනක් නැතැයි කියන ලංකාවේ, දෙමළ ජනයාට මහත් අසාධාරණයක් වන්නේ යැයි කියන ලංකාවේ,  ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩාකරන දෙමළ ජනවාර්ගිකයෙක් වෙයි. ඔහු නිසා බටහිරයන් ලෝකය පුරා ගෙන යන දෙමළ ජනයාට ලංකාවේ අසාධාරණයක් වන්නේය යන බොරුව යම් ප්‍රමාණයකට හෙළිදරවු වෙයි. මුරලිදරන්ට දිගින් දිගට ම සුද්දන් කෙණෙහිලිකම් කරන්නේ ඔහුගේ කළුහම නිසා නො ව මේ කරුණ නිසා යැයි මම සිතමි. සෝබර්ස් නම් කල්ලාගේ නමින් ශූරතා පළිහක් ඩ්‍රාවිඩ් නම් කල්ලකුට දෙන සුද්දෝ කල්ලන්ගේ ආධාරයෙන් තම ක්‍රමය පවත්වාගෙන යති. ඒ අතර තම මතයට විරුද්ධව යන මුරලිදරන් වැන්නන්ට ද දඬුවම් දෙති. කුමාරතුංග මහත්මිය හා සංධානය ද මේ බව අවබෝධ කරගත යුතු ය ~

© Prof. Nalin De Silva